ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

මහජන ආරක්ෂක අමාත්‍යාංශය

SRI LANKA IMMIGRATION AND EMIGRATION

# ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

# ලංසු ඉදිරිපත් කිරීමේ දිනය දීර්ඝ කිරීමේ නිවේදනය

## ශ්‍රී ලංකා ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට ඉලෙක්ට්‍රොනික විදේශ ගමන් බලපත්‍ර මිලියන පහක් (5) සපයා ගැනීමේ ප්‍රසම්පාදනය

## IFB අංකය: PS/03/PB/PR/05/28/23

1. ඉහත ප්‍රසම්පාදනය සඳහා **2023.11.09** දින පළ කළ දැන්වීමේ ලංසු ඉදිරිපත් කිරීමේ දිනය **2024 ජනවාරි 16 (අඟහරුවාදා) (2024/01/16)** තෙක් දීර්ඝ කරන ලදී. පෙර පළ කරන ලද දැන්වීම සහ වෙනත් තොරතුරු අපගේ නිල වෙබ් අඩවිවලින් (www.pubsec.gov.lk සහ www.immigration.gov.lk) ලබාගත හැකිය.

2. **ශ්‍රී ලංකා රුපියල් රු.500,000.00 ක හෝ සමාන මුදලක් ශ්‍රී ලංකාවේ ව්‍යවහාරික මුදලට පහසුවෙන් මාරු කළ හැකි මුදල් වර්ගයකින්** ආපසු නොගෙවන ගාස්තුවක් ලෙස ගෙවීමෙන් හා ව්‍යාපාරික ලිපි ශීර්ෂයකින් ලිඛිත ඉල්ලීමක් **2024 ජනවාරි මස 12** දක්වා සතියේ වැඩකරන දිනවල **පෙ.ව. 9.00 සිට ප.ව. 3.00** දක්වා පහත සඳහන් ලිපිනයේ පිහිටි මහජන ආරක්ෂක අමාත්‍යාංශ කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමෙන් ඉංග්‍රීසි භාෂාවෙන් ඇති සම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටලයක් මේ පිළිබඳව උනන්දුවක් දක්වන සැපයුම්කරුවන්හට මිල දී ගත හැක. ගෙවීම් කළ යුත්තේ මුදලිනි.

3. පහත සඳහන්ව ඇති ලිපිනයට **2024 ජනවාරි මස 16 වැනි දින ප.ව. 2.00** ට හෝ ඊට පෙර ලැබෙන සේ ලංසු ඉදිරිපත් කළ හැක. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු කැඳවීම අවසන් වූ වහාම, **2024 ජනවාරි මස 16 වෙනි දින ප.ව. 2.00** ට මෙම අවස්ථාවට සහභාගි වීමට කැමැත්ත දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේදී තාක්ෂණික ලංසු විවෘත කරනු ලැබේ.

4. සතියේ වැඩ කරන දිනවල ගණකාධිකාරී, මහජන ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් **දුරකථන අංක +94112887328 සහ acc_proc@pubsec.gov.lk** දරන ඊමේල් ලිපිනය ඔස්සේ මේ පිළිබඳව උනන්දුවක් දක්වන, යෝග්‍යතා පූර්ණ ලංසුකරුවන්හට වැඩිමනත් විස්තර ලබා ගත හැකි අතර **2024 ජනවාරි 12 දක්වා ඕනෑම වැඩ කරන දිනයක පෙ.ව. 9.00 සිට ප.ව.3.00** දක්වා කාල පරිච්ඡේදය තුළ දී පහත සඳහන් ලිපිනයේදී නොමිලේ ලංසු ලිපිලේඛන පරීක්ෂාව සිදු කළ හැක. ලංසු ලිපිලේඛන, පරිශීලනය සඳහා පමණක් මහජන ආරක්ෂක අමාත්‍යාංශ වෙබ් අඩවියේ (www.pubsec.gov.lk) සහ ආගමන හා විගමන දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ (www.immigration.gov.lk) පළ කර ඇත.

**සභාපති,**
**අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුව(CAPC)**
**මහජන ආරක්ෂක අමාත්‍යාංශය,**
17 වන මහල, සුහුරුපාය,
ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
2023 දෙසැම්බර් 21

SELACINE MEDIA SOLUTIONS